# ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමග ඔබත් එක්වන්න

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රය අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම ක්ෂේත්‍රය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘතිද රට වෙත ආකර්ෂණය කරයි.

## සහකාර අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණ

තනතුර දරන්නාට සංචාරක සංවර්ධන අරමුදල (TDF) සමස්ත අධීක්ෂණය සහ අධීක්ෂණය කිරීමේ කාර්යය පැවරී ඇත. සහකාර අධ්‍යක්ෂවරයා නිවැරදි මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සඳහා මූල්‍ය කණ්ඩායම සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර, උපායමාර්ගික මූල්‍ය තීරණ ගැනීමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහාය විය යුතුය.

**රාජකාරීන්**

- සංචාරක සංවර්ධන අරමුදල සුපරීක්ෂණය සහ අධීක්ෂණය කිරීම.
- සංචාරක සංවර්ධන අරමුදල් පොදු ලෙජරය ආධාරක ලියකියවිලි සමග නිසි ලෙස නඩත්තු කිරීම සඳහා වගකිව යුතුය.
- සංචාරක සංවර්ධන අරමුදල් මූල්‍ය ප්‍රකාශන සකස් කර අවසන් කිරීම.
- එකතු කරන ලද අරමුදල් අනෙකුත් ආයතන වෙත බෙදා දීම සමාලෝචනය කර සකස් කිරීම.
- ලියාපදිංචි සංචාරක ආයතනවලින් අය කරනු ලබන සංචාරක සංවර්ධන බද්ද අධීක්ෂණය කිරීම සහ හැසිරවීම.
- සියලුම සංචාරක සංවර්ධන අරමුදල් ගණනය කිරීම් අධිකාරියේ නීති රීතිවලට අනුකූලදැයි පරීක්ෂා කිරීම.
- සංචාරක සංවර්ධන බද්ද පිළිබඳ විමසීම් සඳහා තොරතුරු සැපයීම, සංචාරක සංවර්ධන බද්ද ගෙවන්නන් සමඟ අන්තර් ක්‍රියා කිරීම සහ පැමිණිලි විසඳීමට කටයුතු කිරීම.
- බැංකු සැසඳීම ඇතුළුව ලෙජර් ගිණුම් පරීක්ෂා කිරීම සහ සැසඳීම.
- සංචාරක සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට අවශ්‍ය ඕනෑම පාලනයක් නිර්දේශ කිරීම.
- කාලසටහන්, පිළිතුරු සහ සහායක ද්‍රව්‍ය සකස් කිරීම සහ ක්‍රියා පටිපාටි පැහැදිලි කිරීම සම්බන්ධව විගණකවරුන්ට සහාය වීම.
- අධිකාරියේ අධ්‍යක්ෂ/මූල්‍ය කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද වෙනත් රාජකාරි කටයුතු කිරීම.

**අපේක්ෂිත පුද්ගලයා**

**බාහිර අයදුම්කරුවන්**

අපේක්ෂකයා අ හෝ ආ සපුරා තිබිය යුතුය.

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණය / ව්‍යාපාර කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍ය / කළමනාකරණය සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය/ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) / වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA)/ සහතික ලත් ඒකාබද්ධ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) / ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA) අන්තර් මාධ්‍ය මට්ටමේ විභාග සමත්ව තිබීම.

සහ

උපාධිය/ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරණ (JM1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ( උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ).

**වැටුප් පරිමාණය**

MM 1-2 - රු. 94,170 – 10 x රු. 2,480– 15 x රු. 3,450 - රු. 170,720 කි

මූලික වැටුප - රු. 73,436 + ජීවන වියදම

ප්‍රතිලාභ

- සේවකයා සහ පවුල ආවරණය වන පරිදි ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- ප්‍රවාහන දීමනාව
- දුරකථන දීමනාව
- වෘත්තීය දීමනාව
- ණය පහසුකම්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණු

තනතුරට සුදුසු යැයි ඔබ සිතන්නේ නම් අදාළ අයදුම්පත සමග ඔබගේ ජීව දත්ත ඇතුළත් අයදුම්පත (CV) ද අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සඳහා වන සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සමග ලියාපදිංචි තැපෑලෙන් 2025 මැයි 09 වන දින හෝ ඊට පෙර "සහකාර අධ්‍යක්ෂ/ මූල්‍ය" ලෙස ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන්කර පහත ලිපිනයට යොමු කරන්න.

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක : 80, ගාලු පාර, කොළඹ 03.**